# මධ්‍යකාලීන හින්දී කවි කබීර්දාස් සහ යථාර්ථවාදය

එල්. එම්. රිද්මා නිශාදිනී ලංසකාර[1]

හින්දී සාහිත්‍ය ඉතිහාසයේ ප්‍රථමවරට පීඩිත පංතිය වෙනුවෙන් තම හඬ අවදිකොට එකල භාරතීය සමාජයේ වැඩවසම් ක්‍රමයට දැඩිව පහර ගැසූ මධ්‍යකාලීන හින්දී කවියෙකි කබීර්දාස්. නිර්ගුණ් භක්ති සම්ප්‍රදාය නියෝජනය කරනු ලබන ප්‍රකට මෙන්ම දක්ෂ කවියෙකු ලෙසට මොහු හඳුන්වාදීම, හින්දී සාහිත්‍යයේ සම්ප්‍රදායකි. කබීර්දාස් තම මුල්කාලීන නිර්මාණ හරහා නිර්ගුණ් භක්ති සම්ප්‍රදාය ආධාර කොට ගනිමින් දේව භක්තිය පිළිබඳ තම අදහස් ප්‍රකාශ කළ බව සත්‍යයකි. එනමුත් එයම හේතුවක් කොට ගෙන ඔහුගේ අනන්‍යතාව නිර්ගුණ් භක්ති සම්ප්‍රදාය හා අවියෝජනීයව දැකීම සාධාරණ නොවේ. ඒ මක්නිසාද යත් ඔහු පසුකාලීනව තම කවිය ඔස්සේ එවකට භාරතීය සමාජයේ විරාජමාන උසස් යැයි සම්මත පැලැන්තියට විරුද්ධව සාමාන්‍ය දිළිඳු ජනතාව හා අත්වැල් බැඳගත් උදාර සමාජවාදියෙකු වූ බැවිනි. හින්දී සාහිත්‍යයේ නිර්ගුණ් භක්ති සම්ප්‍රදායේ දේව භක්තිය ප්‍රකාශ කරන්නාවූ කවියෙකු ලෙසට ප්‍රකට මෙවැනි වූ යථාර්ථවාදී කවියෙකුගේ සැබෑ අනන්‍යතාව විශ්ලේෂණාත්මකව හඳුනාගැනීම මාගේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. තවද මධ්‍යකාලීන භාරතයේ භක්ති ආන්දෝලනයට කබීර්දාස් කවියාගෙන් ලැබුණු දායකත්වය සහ විඥානවාදය අතහැර යථාර්ථවාදය වැළඳ ගැනීමට ඔහුට පාදක වූ සමාජ පසුබිම හඳුනා ගැනීම ද මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ. මෙය මූලාශ්‍ර අධ්‍යයනයක් වන අතර ඒ සඳහා ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය භාවිත කරනු ලැබ ඇත. යථාර්ථවාදය පිළිබඳ සාකච්ඡා කළ කාර්ල් මාර්ක්ස්ටත් පෙර, මාර්ක්ස් විසින් හඳුන්වා දෙන ලද යථාර්ථවාදයේ පදනම වන ද්විසටනාත්මක භෞතිකවාදය, කබීර්දාස් කවියා එකල තම පද්‍ය නිර්මාණ ඔස්සේ ලොවට හෙළිකොට ඇති බව ඔහුගේ නිර්මාණ පරිශීලනයේදී මට පසක් වූ වැදගත් කරුණයි. ජර්මානු විද්වතුන් දෙදෙනෙකු වන හේගල් සහ ෆයරබාන් විසින් ඉදිරිපත් කරන ලද සිද්ධාන්ත වන 'ද්විසටනාත්මක පද්ධතිය' සහ 'භෞතිකවාදය' ගුරු කොට ගනිමින් පසුකාලීනව විද්‍යාත්මක පසුබිමක පිහිටා මාර්ක්ස්, යථාර්ථවාදයේ පදනම ලෙසට ද්විසටනාත්මක භෞතිකවාදය නමැති සිද්ධාන්තය ඉදිරිපත් කොට ඇත. නමුත් මාර්ක්ස්, හේගල් සහ ෆයරබාන් යන තිදෙනාටම ප්‍රථම කබීර්දාස් තම නිර්මාණ හරහා යථාර්ථවාදය ලොවට ඉදිරිපත් කොට ඇත. වෙනස, එය 'කබීර්දාස්වාදය' ලෙසට ලෝකයා අතර ප්‍රචලිත නොවීමයි.

**ප්‍රමුඛ පද:-** මධ්‍යකාලීන හින්දී කවි,නිර්ගුණ් භක්ති සම්ප්‍රදාය,විඥානවාදය,යථාර්ථවාදය,ද්විසටනාත්මක භෞතිකවාදය

,

[1] හින්දී අධ්‍යයන අංශය, rnishadinee8822@gmail.com